සමාජය තුළ කාලාන්තරයක් පුරා භාවිතා වන ඇතැම් යෙදුම් තවදුරටත් භාවිතා කිරීම කෙතරම් යෝග්‍යද යන ගැටළුව මතුවන්නේ, ප්‍රධාන වශයෙන්ම එවැනි යෙදුම් හා බැඳී ඇති ගර්හාත්මක අදහස් හා කොන් කිරීමේ ආකල්පයන් නිසායි. ඊට උදාහරණයක් ලෙසින් "ගණිකාව" යන යෙදුම දැක්විය හැක.

ගණිකාව යන යෙදුම නීති පොත් තුළ පවා තවමත් භාවිතා වුවද, එම යෙදුම හා සමගින් බැඳී ඇති සමාජ ගර්හාත්මක සහ කොන් කිරීමේ ආකල්පය නොසලකා හැරිය නොහැක. එනිසා, මාධ්‍ය මගින් "ගණිකාව" යන්න වෙනුවට වඩාත් මධ්‍යස්ථ යෙදුමක් යොදාගැනීමේ අවශ්‍යතාවයක් පවතී. මේ හා සමාන පුවත් වාර්තාවන් සඳහා ඉංග්‍රීසි භාෂා මාධ්‍ය තුළ sex worker යන යෙදුම භාවිතා වේ. එම නිසා, සිංහල භාෂා මාධ්‍ය තුළ ඒ සඳහා "ලිංගික ශ්‍රමික" යන යෙදුම යෝග්‍ය නොවන්නේද? නැතිනම් ඒ සඳහා වෙනත් යෝග්‍ය යෙදුම් ඔබට යෝජනා කළ හැකිද?

#MediaEthicsSL #lka #SinhalaPress #SundayDivaina #Divaina